# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1743/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 23/11/2024 පැය 0600

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - කොස්ලන්ද පොලිස් වසම.

2024.11.22 වන දින උදෑසන කාලයේ කොස්ලන්ද පොලිස් වසමේ හාමුදුරුකන්ද ප්‍රදේශයේ පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට කොස්ලන්ද පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මේ සම්බන්ධව විමර්ශන සිදුකිරීමේදී තණමල්විල පොලිස් වසමේ පදිංචි පුද්ගලයෙකු 2024.11.18 වන දින අතුරුදහන්ව ඇති බවට තණමල්විල පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර ඇති අතර, එම අය තවත් පුද්ගලයෙකු සමඟ ඉහත හාමුදුරුකන්ද ප්‍රදේශයට ගොස් ඇති බවට අනාවරණය කරගෙන ඇත.

අතුරුදහන්වූ පුද්ගලයා සමඟ ගිය බවට හඳුනාගත් වයස අවුරුදු 45 ක් වන බලහරුව ප්‍රදේශයේ පදිංචි අනෙක් පුද්ගලයා කොස්ලන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී ඔහු විසින් අතුරුදහන්වූ පුද්ගලයාගේ ගෙල කපා ඝාතනය කර හිස කොටස වල දැමූ බවට අනාවරණය කරගෙන ඇත. ඒ අනුව මරණකරුගේ කඳ කොටස හා හිස කොටස පොලිසිය විසින් සොයා ගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ අරබේකෙම, තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිද්ධිය සම්බන්ධව බණ්ඩාරවෙල ගරු මහේස්ත්‍රාත් තුමා විසින් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර ඇත. මරණකරු සහ සැකකරු ඌව කුඩාඔය ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් සමඟ අනියම් සම්බන්ධතාවයක් පවත්වා ඇති අතර, ඔවුන් අතර ඇතිවූ ආරවුලක් මත මරණකරුව ඉහත ප්‍රදේශයට කැඳවාගෙන ගොස් මෙම ඝාතනය සිදුකර ඇති බවට විමර්ශණයේදී අනාවරණය වී ඇත.

මෙම ඝාතනය සම්බන්ධයෙන් වයස අවුරුදු 44 ක් වන ඌව කුඩාඔය ප්‍රදේශයේ පදිංචි සැකකාරියද පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. කොස්ලන්ද පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. දේපල සොරකම් වලට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - නවගමුව පොලිස් ස්ථානය.**

2024.11.22 වන දින උදෑසන කාලයේ නවගමුව පොලිස් වසමේ දැඩිගමුව ප්‍රදේශයේදී නවගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 570 ක්** සන්තකයේ තබා ගෙන ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු ත්‍රීරෝද රථය සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන දැඩිගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු පැමිණි ත්‍රීරෝද රථය සොරකම් කරන ලද ත්‍රීරෝද රථයක් බවට හා ප්‍රදේශයේ ගෙවල් බිඳ දේපල සොරකම් රැසකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත. සැකකරුට කඩුවෙල හා හෝමාගම ගරු මහේස්ත්‍රාත් අධිකරණ මගින් වරෙන්තු 04ක් නිකුත් කර ඇති අතර, සොරකම් කරන ලද දේපල වලින් ජංගම දුරකතන 04 ක්, අත් ඔර්ලෝසු 02 ක්, රයිස් කුකර් 01 ක් හා අත් පලදනා 02 ක් පොලිසිය විසින් සොයා ගෙන ඇත.

නවගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අපරාධයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.11.22 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ කටුකුරුඳුවත්ත ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 400 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන බඩෝවිට, ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල විමර්ශනයේදී දෙහිවල පොලිස් ස්ථානයට වාර්තා වී තිබූ රාත්‍රී කාලයේ නිවසකට අනර්ථයක් සිදුකර රන් භාණ්ඩ හා දේපල සොරකම් කිරීමේ අපරාධයට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.11.22 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2024.11.22 වන දින රාත්‍රී කාලයේ තලංගම පොලිස් වසමේ 08 කණුව ප්‍රදේශයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 වන තලාහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ජාඇල පොලිස් ස්ථානය.**

2024.11.22 වන දින රාත්‍රී කාලයේ ජාඇල පොලිස් වසමේ ගල්ලවත්ත ප්‍රදේශයේදී ජාඇල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 වන ඒකල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාන්කුලම් පොලිස් ස්ථානය.**

2024.11.22 වන දින අළුයම් කාලයේ මාන්කුලම් පොලිස් වසමේ වච්චික්කුලම් වැව් රක්ෂිත ප්‍රදේශයේදී මාන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන තුණුක්කායි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පුලියන්කුලම පොලිස් ස්ථානය.**

2024.11.22 වන දින සවස් කාලයේ පුලියන්කුලම පොලිස් වසමේ පෙරියමඩු ප්‍රදේශයේදී පුලියන්කුලම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන මල්ලාවි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුලියන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරිල්ල පොලිස් ස්ථානය.**

2024.11.22 වන දින දහවල් කාලයේ ගිරිල්ල පොලිස් වසමේ එළගම්මිල්ලව ප්‍රදේශයේදී ගිරිල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන මීවැල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගිරිල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් නව දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නුවරඑළිය කඳවුර .

2024.11.22 වන දින උදෑසන කාලයේදී බගවන්තලාව පොලිස් වසමේ මාඑළිය රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා නුවරඑළිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින්** සිටි සැකකරුවන් නව දෙනෙකු මැණික් ගැරීමට උපයෝගී කර ගත් උපකරණ සමග අත්අඩංගුවට ගෙන බගවන්තලාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20ත් 60ත් අතර වයස්වල පසුවන බගවන්තලාව හා බෙලිහුල්ඔය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බොක්කාවල පොලිස් ස්ථානය.

2024.11.22 වන දින සවස් කාලයේදී බොක්කාවල පොලිස් වසමේ නාවින්නාපිටිය ප්‍රදේශයේදී බොක්කාවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නිවසක් තුල **පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන පූජාපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බොක්කාවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මෘත ශරීරයක් හමුවීම - මංගලගම පොලිස් වසම.

2024.11.22 වන දින රාත්‍රී කාලයේ මංගලගම පොලිස් වසමේ 27 කණුව ප්‍රදේශයේදී පුද්ගලයෙකු හේනක ඔයක් අසල මියගොස් ඇති බවට මංගලගම පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වන 27 කණුව, මංගලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2024.11.20 වන දින සිට නිවසට පැමිණ නොමැති බැවින් ඔහුගේ සහෝදරයා විසින් හේනට ගොස් සොයා බැලීමේදී මංගල ඔයේ ඉවුර අසල තිබී මෘත ශරීරය හමුවී ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර, මංගලගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - තණමල්විල පොලිස් වසම.

2024.11.22 වන දින සවස් කාලයේ තණමල්විල පොලිස් වසමේ තණමල්විල උඩවලව මාර්ගයේ නයිවල ප්‍රදේශයේදී තණමල්විල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ ලොරි රථයක් දකුණට හැරවීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා තණමල්විල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 58 ක් වූ මහවැව, සූරියආර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තණමල්විල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**